# නිර්මාණ Nirmana



## පොසොන් සඳ

දෙදහස් වසරකට පෙර දින පොසොන් මසේ
පුන්සඳ නැගුණු මිස්සක පව්වට පෙරසේ
සුළු ඇත් පා සුතුර වදහළ බුදුන් ලෙසේ
සිහිවෙයි මිහිඳු මහ රහතන් වහන්සේ

දම්සෝ නිරිඳුගේ අදිරද පුත් ලෙස ට
නොව, බුදු පුතෙකු ලෙස වැඩියා දිවයින ට
දෙසමින් දහම් රජ හා මැති ඇමතින් ට
දහම් දිවයිනක් කරදුනි වැසියන් ට

මහරජ ඔබට ලැබදුන් උරුමයක් නැත
මේ ලක් දෙරන හැමටම අයිතියක් ඇත
ගස් වැල් සමග පණ ඇති සත් කැලක් ඇත
ඒ හැම රකින යුතුකම ඔබ සතුව ඇත

මේ ලෙස කියා දී සුන්දර මිනිස් ගතී
ලොව මවිතයට පත් කළ මහ වැව් පැවතී
මිහිරි වදන් කැටිවුණු සොමි ගුණෙන් රුතී
මිනිසුන් ඇති කළා පවතින උතුම් ගතී

තෙරුවන් ගුණය තෙවලා දහමද එක සේ
බෙදමින් දහම බස හා සිප්සත සොඳ සේ
මිනිසුන් හදා යහ සිතුවිළි මතුවන සේ
දැය යොමු කළේ දෙස බස රැස රකින ලෙසේ

ජාතියෙ පිනට වැඩමෙව් පින්වතා ණෙනී
ලොව මිනිසුන් අතර ගරුසරු බව රැකුණී
දහමින් සදාචාරය හෙළ ගති ලැබුණී
අප ණයගැතියි ජාතිය සමිඳුනි නිතිනී

*රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති*
♦ **පූජ්‍ය පන්නල සුමේධ ස්ථවිර**
**Thames Buddhist Viharaya, Surrey UK**

## TO MY DEPARTED BROTHER

Good old memories come to my mind
Mingled with joy and sombreness
The time we spent no more to find
Proving that craving is meaningless

You lost your sweet childhood
With no fault of yours at all
Sadly none could understand
Your mental agony with no cry or call

Loving tender care we mind
That you deserve to be received
None could give the same with kind
Except the Mother who only perceived.

Forgive me brother for the mistakes I made
While you pardon, I repent with pain
The more I think, the more I wade
Through the pitch darkness in vain

None would make you suffer any more
As you are with Angels away
We now suffer more and more
As the sins we committed cannot pay

Seen your room with mind that pierce
How everything kept neat and well
When all are touched with full of tears
Still I feel your sweet smell

None could avoid the death that cruel
This is the eternal truth though pain
Yet, please come back as a Crown Jewel
And Good Bye Sweet Brother, till we meet again!

♦ **Jayantha Wewelwala - London NW9**

## හිමිසඳු නිසයි නිවනේ රන් දොර ඇරුණේ !

නොදියුණුවෙ අඳුරු සමුදුරු පතුළෑ රැඳී
තිබු අවදියෙක අම සදහම් තරඟ දිදී
හිමි වැඩි පිනින් මොහොඳුරු බෙලිකටුව බිඳී
පෙරදිග මුතු ඇටය ලෝකය දකින ලදී

නරදෙටුවනුදු වල් වැද දුනුදිය බැවේ
පර පණ නසන රිසියෙනි කැර ජය රාවේ
හිමි පා තඹර රොන් රස කෙදිනද නැවේ
එදිනයි හෙළේ හෙළයා හෙළයෙකු වූවේ

ඇඳුමෙහි පැළඳුමෙහි යන එන ලතා වෙහී
කන බොන පිළිවෙලෙහි සුකොමළ කතා වෙහී
දිස්වන උසස් පිළිවෙත් හැම වතා වෙහී
වැඩුණේ සෙවනෙහිය හිමි ගුණ විතා නෙහී

ඉර හඳ අහස ගස් ගල් දෙවියන් පරිදී
සලකා මුලාවෙන් ඇදහුවන් පෙරදී
නුවණැස ලබන ලද්දේ දකිමින් වැරදී
හිමි දෙසු බසිනි සඟ මහ පෙන්නුම් කරදී

දඩ කෙළියෙහි බැඳුණු සිහළිඳු දකින් නට
අනුබුදු මිහිඳු ආගමනය නොවන් නට
විල්පත්තුවක් යාලක් වන සතුන් හට
කෙම් බිම් වෙයිද රිසිසේ සැරිසරන් නට

දිවසරහනත් සීගිරියෙහි පිරි වැරුණේ
ගල්කුළු පළාගෙන මුදු බුදු ගුණ පෙරුණේ
ආ මහ මහාවංසයකින් හෙළි කැරුණේ
හිමිසඳු නිසයි නිවනේ රන් දොර ඇරුණේ

♦ ***බද්දේගම එච්. එල්. අමරසේකර***
**Sri Lanka**

## පොසොන් උදාව

හිනැහෙනවා පොසොන් සඳ පෙරදිග අහසේ
හැම වසරකම දුටුවෙමි දෙනෙතට සුවසේ
අනුබුදු මිහිඳු හිමි සිහිකර අද දවසේ
ඉගිලී ගියා මිස්සක පව්වට රහසේ

සැම වසරකම ජය සිරිමා සමිඳු වැඳ
මතකයි පිහිට පැතු හැටි පුද පඬුරු බැඳ
දිවියට දැනුණු අගහිඟ කරදර මැදද
කාලය ගෙවමි ලන්ඩන් සීතලය විඳ

සේපාලිකා දෝතට ගෙන සඳ පානේ
දරුවන් සමග වැන්දා අටමස් ථානේ
දන්සැල් තිබුණාය එහි අඩියක් ගානේ
කෑ බත් රසය තාමත් ලැබුණේ නැනේ

අඹ දඹ පේර රඹුටන් ගොඩවල්ද කපා
පායා දිලෙන සඳ දැක්මත් සිතට සැපා
අනුබුදු හිමියනේ අද මම ඔබගෙ දෙපා
ලන්ඩන් බිමේ සිට නමදිමි පොළව දපා

*විශ්‍රාමලත් පාඨශාලාචාරිණී*
♦ ***රත්නාවලි කුමාරි දිසානායක***
Hounslow Middx **UK**

## අහිම්වීම

සයුරු රළ වලිග සුහෙකින් පරක් කර
දරුවන් සොයා යදිමින් ඉසිඹුවෙන් තොර
ලෙහෙනුන් එදා වැළපුණු අයුරු සිහි කර
හදවත සැළිණි නුඹ නෙත ගැටි පළමු වර

විලක් මැද සුපිපි සියපත නුඹයි කියා
මලක් සේම රකිමින් සෙනෙහසින් දයා
වසන්තයේ පීදුණු මල් කැකුළ නියා
ගිමන් කලෙක ඇය රහසෙම පරව ගියා

සිහිලැල්ලේ ගඟුලැල්ලේ අප උන්නා
නිකැලැල්ලේ හද සිනහා මල් පිපුණා
සැනසිල්ලේ උතුරා ගිය තොස බිඳුණා
ළතැවිල්ලේ දිවි වීණා තත මිඳුණා

මාපියවරුන් දරුවන් අහිමි වුණු සඳ
ළය හුණු වී රුහිරු කඳුළින් ගලන ලෙද
ඒ මාපියන් නොකලෙක අහිමි වුණ සඳ
දරුවන් ළය රිදුම ඔබටත් දැනෙන වද?

♦ ***අචිනි කල්හාරි ලියනදුර***
***නීති පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය***

## අලුත් සැරයටිය

වසත් කල ගිය
වන්දනාවේ දිගු නවාතැන් පොළ
නැවති නැවතී ගිමන් හැරලා
සෙවූ මුත් මිහිරිතම වූ ගීතයක්
හමුවුණේ නෑ ගී හඬක්

දිනක් දොඩමළු වුණා සෙවනැලි
සඳේ රැස් දහරින්
නැර ආ සෙවනැල්ල විගසින්
මිමිණුවා රහසක්
එදා නොගැයූ ගීයක්
මෙතැන් සිට මම නුඹට
වෙන්නම් අළුත් සැරයටියක් !

♦ ***වසන්තා කුමාරි දසනායක***
**මයිලමූන ගිරිඋළුමල**
**Sri Lanka**

## පොසොන් අසිරිය !

පොසොන් පෝය දා
අඹතල ගල මත
අනුබුදු සමිඳුන්
වැඩ සිටි අසිරිය

සිරිමත් බුදු සව්
සිරි මුව සිළිලෙන්
සිරි සදහම් දිය
විසුරුණු අසිරිය

රජුගෙ සසල සිත
නිසසල කරමින්
කිරුළ පැළඳි හිස
බිම රැඳි අසිරිය

සිරිබර සිරිලක
ගව්වෙන් ගව්වට
අහස සිඹින සෑ
ඉදිවුණු අසිරිය


රළු කළුගල් මුදු
කරුණා ගුණ පිරි
සම්බුදු රූ සිරි
ගැන්වුණු අසිරිය

♦ ***ප්‍රේමසිරි කාරියවසම්***
**Sri Lanka**

## සාදු! සාදු!

ගල් පඩිපෙළ දිගේ
ඉහළට පා තියමී
මිස්සක පව්ව නැග
මම බැති ගී ගයමී
අනුබුදු පියාණන්
වැඩ සිටි තැන සොයමී
සාදු! සාදු! කියමින්
මගෙ හිස තබමී

♦ ***අමාෂා සුරනි සමරසිංහ***
**වෙල්ගම තිත්තපන්නර**



## දුක්වීම

එ ක ම සතෙකු තම මව් මළ දුකටා
වෙ න ම හැඬූ කඳුලේ බිඳු වලටා
මෙහැම මුහුදු දිය අඩුවන කලටා
ත ව ම සසර ආලය ඇයි තොපටා
\- ***ලෝවැඩ සඟරාව***

අප ගෙවන ජීවිතය පුරා අප දුක්වූ හඬා වැළපුණු අවස්ථා කොතෙක් දැයි අපට මතක නැත්තේ එය ගණනින් කියන්නට නොහැකි ප්‍රමාණයක් වන බැවිනි. ප්‍රසිද්ධියේ දුක් වුවාට වඩා අප තනිවම දුක්වූ අවස්ථාවන් වැඩිය. එය බොහෝ විට වෙනත් කිසිවෙකු දන්නේ නැත. දුක ජීවිතයට පොදු දෙයක් යයි කියනවාට වඩා මුළු ජීවිතයම දුකක් යයි කීවොත් එය වඩා නිවැරදිය. දුක ඉතාම ස්වල්ප වෙලාවකට පමණක් නැවතුණු විට අපි එයට ප්‍රීතියයයි කියමු. එසේ නැතුව ප්‍රීතිය කියා වෙනම දෙයක් ජීවිතයේ නැත.

සංසාරයේ උපදින හැම වාරයකම කෙනෙකු තම මව මියගිය විට ඒ දුකට හැඬූ කඳුළු එකතුවූ විට එය මහ මුහුදේ ජලයටත් වැඩියයි බුදුදහමේ සඳහන් වෙයි. සංසාරය කොතරම් විශාලදැයි ඉන් සිතා ගත හැකිය.

## මිහිඳු සමිඳු වැඩිය දිනයි !

මිහින්තලා කඳු මුදුනට අනුබුදු හිමි වඩින වා
බුදුන් දෙසූ අම දම් සුව ලක් දෙරණට හමන වා
පොසොන් පුරා පුන් පෝදා දහම් එළිය දිලෙන වා
බවුන් වඩා නිවන් මගට සැම දන සිත් යොමන වා

අපිත් එදා සිටියා නම් අනුබුදු හිමි වඳින වා
දොහොත් තබා හිමි පාමුල මෙත් සිසිලස විඳින වා
දනක් පුදා රහතුන් හට පාරමිතා පුරණ වා
කෙලෙස් නසා බව කතරේ එතෙරට පිය නගන වා

රුවන් මහා සෑ ඉදිවී අනුරපුරේ දිලෙන වා
මුවන් හැඹූ පැතිස් රජ බුදු සිසිලෙන් නිවෙන වා
මිහින්තලා අඹ වනයේ දන් සිල් පින් කරන වා
පිනක් බෙලෙන් ලක් දෙරණේ අප ඉපදී සිටින වා

♦ ***සමන්මලී සේනානායක***
**Luton UK**

## තවමත් පෙනේ ගල මුදුනේ කහපාට

පින්බර පොසොන් පෝ දින ලක්බිමට වැඩ
පින් පව් හැඳින ගන්නට දී අපට ඉඩ
සම්බුදු හිමිගෙ දහමෙන් මෙහි නැගුව හඬ
පැතිරෙයි තවම හිමියනි හැම දෙයම මැඩ

ලක්වැසි දනට ලැබ දෙන්නට නිවන අම
පැතිස් රජු හටත් පෙන්වූ ගුණය සම
පැල්පත වෙතත් විහිදුව සම සිතිනි හැම
අනුබුදු පියේ ඔබෙ පා යුග වඳිමි මම

ඇත් අඩි සුතුර හිමියනි ඔබ දෙසන ලද
මිහින්තලාවෙන් ගුවනට නැගුණු සඳ
එමගින් යොමුව දහමට ලක් දනගෙ හද
සිල්වත් වුණා හෙළ දිවයින නොසිතු ලෙද

පුරසඳ පොසොන් නිල් ගුවනට නැගි දාට
මිස්සක පව්ව එළියයි එම දින රැට
නැතිමුත් මහිමි රුව දක්නට හැම දාට
තවමත් පෙනේ ගල මුදුනේ කහ පාට

බුදු බණ හිතට ගත් විටදී නිසන් සලේ
නොමැතිව සැකය සිත සුවයකි නිදන් කළේ
සිහිපත් කරන අනුබුදු හිමි පහන් පැලේ
අපි වැඳ වැටෙමු කඳු පාමුල මිහින් තලේ

♦ ***අසංග ප්‍රසාද් වීරපුර*** **Sri Lanka**

## අරහත් මිහිඳු හිමි

ගස් ගල් වලට වඳිමින් දන සිටින සඳ
දම්සෝ නිරිඳු කුළුණැස මෙහි යොමන ලද
ඔහු පුත් මිහිඳු හිමියන් මෙහි වැඩිය සඳ
සිරිලක දහම් දිවයින නම ලබන ලද

තිස්සය මෙහි එන්න තිස්සය මෙහි එන්න
තිස්සය ඉතින් ඔය දුනු හී බිම ලන්න
විස්මිත ලෙසින් රජතුම ගල් ගැසී උන්න
දිස්විය මිහිඳු හිමි අඹතලයෙහි උන්න

පැතිස් නිරිඳු දුනු ඊතල බිමට දමා
විසඳී අඹ පැනය තම සිහි නුවණ යොමා
වැඳ හිමි පාද බැතියෙන් සිය දෙදණ නමා
ලක්දීපයට විය මුල් බොදු රජුන් තමා

දම්සෝ නිරිඳු තම පුතු එහි එව් හින්දා
මගෙ ලක් මවට දෙයි නව එළියක් කැන්දා
මිස්සක පව්ව රන් පවුරක් කළ හන්දා
මගෙ ලක්බිමට දෙවියොත් දෙවරක් වැන්දා

♦ ***එස්. කංකානම්ගේ*** **London SE 5**

## පොසොන් ගීතය

රු ව න් වටින දම්පද ගැන උදම් අනා
සු ළ න් රොදක් පැතිරෙයි සුවඳකින් මනා
මි හි න් තලා ගෙන ලොවකට සුරං ගනා
පොසොන් තරිඳු නංවයි රත්තරන් සිනා

තමන් ලයෙහි උතුරා අම මිහිර බැතී
විමන් වලින් දෙවඟන පුද පිණිස එතී
හමන් නට දෙමින් සුළඟට ඇතිව රුතී
සමන් ලියෝ අනුබුදු බැති සුවඳ දෙතී

සැ න සී නිතර වීමෙන් උනුනුන් තුරුළු
වෙ න දා වගේ නොකියති ආදර පිරුළු
පි න පැදී හිසේ පැළඳූ බැති කිරුළු
ගු ණ ගීතිකා මෙනි මෙහි ගී නද කුරුලූ

පා සුබ ලකුණු ගෙන සිරි සදහම් දනය
මා ඔබ නොවැඩියා නම් අද අස රණය
පා සිඹ සිහි කරමි හිමි පින්බර ගුණය
මී අඹ පැණි පිරුණේ හින්දද අඹ පැනය?

ඇහින් දකින රුව සිරිබර මුවේ නම්
ර හි න් රහ දෙසුව සදහම් අමා නම්
පි හි න් නට සුදුසු පා සිරි දෙපා නම්
මි හි න් තලා වී මා ඉපදුනා නම්!

***කිවිපති -***
***කරගම්පිටියේ ජයවංශ පෙරේරා***